රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND HOME AFFAIRS
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
**Website : www.pubad.gov.lk**

දුරකථන / தொலைபேசி : / Telephone (94) 011-2696211-13
ෆැක්ස් / பெக்ஸ் : / Fax (94) 011-2695279
ඊ මේල් / இ-தபால் : / E - mail secretary@pubad.gov.lk

මගේ අංකය / எனது இல : / My No — ඩීඑස්පී/වාස්මා/2010/ඒසේ/v
ඔබේ අංකය / உமது இல / Your No
දිනය / திகதி / Date — 2009.12.10

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිසාපතිවරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## 2010 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ
## ඒකාබද්ධ රියදුරු සේවය

2010 වාර්ෂික ස්ථාන මාරු නියෝග කරමින් දැනටමත් ඔබ වෙත එවනු ලැබ ඇති මගේ සමාංක හා 2009.10.27 දිනැති ලිපිය හා අදාල ස්ථාන මාරු ලේඛනය වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලැබේ.

02. එම ස්ථාන මාරු සම්බන්ධයෙන් මා වෙත ඉදිරිපත් වූ අභියාචනා පිළිබඳව ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ තීරණ මේ සමග ඔබ වෙත එවමි.

03. **2010 වාර්ෂික ස්ථානමාරු වීම් සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් එවනු ලැබූ අංක SP/SB/06/09 සහ 2009 නොවැම්බර් මස 26 වන දින දරන චක්‍රලේඛය අනුව නිකුත් කරනු ලැබූ මගේ සමාංක හා 2009.12.02 දිනැති ලිපිය මගින් 2010 වාර්ෂික ස්ථානමාරු නැවත නියමයක් කරනතුරු කල්දමන ලදී. ඒ අනුව මෙම ලිපිය මගින් දන්වනු ලබන ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණ ද කල්දමනු ලැබූ වාර්ෂික ස්ථානමාරු වලංගු වන දින සිට ක්‍රියාත්මක වන බව දන්වමි.** ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන මාරු වීම් ලබා ඇති නිලධාරීන් අදාල දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි මුදා හැරීමට ක්‍රියා කරන මෙන් මෙයින් දන්වමි.

05. වාර්ෂික ස්ථානමාරු වීම් යටතේ මා විසින් දී ඇති ස්ථාන මාරු නියෝගවලට අමතරව අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග යටතේ කිසියම් නිලධාරියෙකුට ස්ථාන මාරු වීමක් ලැබී තිබුනේ වුවද, මෙම සමාලෝචන කමිටු තීරණ වලින් වූ සංශෝධනවලට යටත්ව 2009.10.27 දිනැති ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු බව සැලකීම මැනවි.

06. තවද නියමිත දිනයේදී අභිනව සේවා ස්ථානයේ රාජකාරී කටයුතු භාර ගැනීමට හැකිවන පරිදි දැනටමත් ස්ථාන මාරු නියෝග ලැබ සිටින නිලධාරීන් ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොසිට ඔබ කාර්ය ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන මෙන්ද කාරුණිකව දන්වමි.

බී.පී.පී.එස්.අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.